

# හා පැංචාගේ පාසල් නිවාඩු කාලය


හයන්සා ගයින්දි නවරත්න.

1-බී ශ්‍රේණිය,

මහමායා බාලිකා විද්‍යාලය ,

මහනුවර

කෘතියේ නම - හා පැංචාගේ පාසල් නිවාඩු කාලය

ප්‍රථම මුද්‍රණය - 2023.11.15

කතාව සහ චිත්‍ර - හයන්සා ගයින්දි නවරත්න

කතෘගේ ලිපිනය - 69/3,නාපාන
මැණික්හින්න.

පාසල - මහාමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 1 ශ්‍රේණිය B

පිදුම

මා ආදරණීය අම්මා අප්පච්චි ට

හා

තමිලා ගුරුමෑණියන්ට

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

## ස්තුතිය

හා පැංචාගේ පාසල් නිවාඩු කාලය නැමති කතාන්දර පොත නිර්මාණය කිරිමට මඟ පෙන්වූ මාගේ පන්තිභාර ගුරුතුමිය වන 1-බී ශ්‍රේණියේ තමිලා ගුරුමෑණියන්ටත් ,

සෙවනැල්ලක් මෙන් මා පසු පස සිටින මාගේ ආදරණීය අම්මා, අප්පච්චි හා ලොකු අත්තාටද මාව දිරිගැන්වූ ධර්මරාජ විද්‍යාලයේ ඉගෙනුම ලබන මාගේඅයියා දෙනුවන් බංඩාරට ත් මහමායාවේ ඉගෙනුම ලබන මාගේ ආදරණීය අක්කා දෙව්මිණී කුමාරිටත්, නන්අයුරින් උදව් කල සියලුම දෙනාටත් මාගේ පන්තියේ යෙහෙළියන්ටත් මාගේ හදපිරි ස්තුතිය පුදකරමි.

හයන්සා ගයින්දි නවරත්න.


1-බී ශ්‍රේණිය,

මහමායා බාලිකා විද්‍යාලය ,

මහනුවර



එක් කැලෑවක හා
පැංචෙක් සිටියා. ඒ හා
පැංචාට ඉස්කෝලේ
නිවාඩු දුන්නා


හා පැංචා
නිවාඩු කාලේ
සෙල්ලම් කරමින්
සතුටින් සිටියා.



ඒ වගේම හා


පැංචා ගෙදර වැඩ වලටත්,
යාළුවන්ටත් උදවු කළා.



හා පැංචා එයාගේ
අම්මාට මල් වවන්නත්,
එළවළු වගා කරන්නත්
උදවු කළා.



එක් දිනක් හා
පැංචා එයාගේ
යාළුවා වන ඉබි හාමිත් එක්ක
කථා කරන්න
ගඟ ගාවට ගියා .



ඉබි හාමි,හා පැංචා
දැක සතුටු වුණා.
ඉබි හාමියි හා පැංචයි
සතුටින් සෙල්ලම් කළා.


ඉබි හාමි කිව්වා
හා පැංචාට
චිත්‍ර ප්‍රදර්ශනයක් තියමු
කියලා.හා පැංචා හා කිවුවා.


හා පැංචයි ඉබි හාමියි ලස්සන
ලස්සන චිත්‍ර ඇන්දා.


හා පැංචයි ඉබි හාමියි
එයාලගේ
චිත්‍ර යාළුවන්ට පෙන්වා
සතුටු වුණා


හා පැංචා එයාගේ
නිවාඩු කාලේ සතුටින් හා
විනෝදයෙන් ගත කළා.



හයන්සා ගයින්දි නවරත්න
1 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විදුහල
මහනුවර

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN : 978-624-206-820-6